# මූලික පිරිවෙන් වර්ෂාවසාන පරීක්ෂණය-2015

Primary Piriven Year End Term Test - 2015

3 වසර /Grade 3

සියලු ම හිමිකම් ඇවිරිණි)
All Rights Reserved)

**සිංහල**

**SINHALA**

කාලය : පැය 03 යි.
Time : Three hours.

පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න 06කට පිළිතුරු ලියන්න.

01) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා ගෙන වචන 200කට නොඅඩු රචනයක් ලියන්න.

i. අසිරි සිරි ඇසළ පෙරහැර.
ii. මත් රකුසාගෙන් වැළකෙමු.
iii. ආනන්ද හාමුදුරුවෝ.
iv. විද්‍යා හා තාක්ෂණ ඥානයේ අවශ්‍යතාව.
v. දිනෙන් දින ඉහළ යන මාර්ග අනතුරු.

(ලකුණු 25)

02) (අ) මහාප්‍රාණාක්ෂර 10 ලියා දක්වන්න.

(ලකුණු 05)

(ආ) පහත සඳහන් වචන බැඳි අකුරු භාවිත කරමින් ලියන්න.

i. සන්ධි = ..............................
ii. භාග්‍ය = ..............................
iii. විචක්ෂණ = ..............................
iv. බුද්ධ ධර්මය = ..............................
v. පරීක්ෂණ = ..............................

(ලකුණු 05)

(ඇ) පහත සඳහන් වචනවල හිස්තැනට සුදුසු අක්ෂරය වරහන තුළින් තෝරා ලියන්න.

i. පුස් ...... කාලය. (ත , ථ)
ii. දර්ශ ...... ය. (න , ණ)
iii. සඳකඩ පහ ....... (න , ණ)
iv. මැටි පහ ....... (න , ණ)
v. ප්‍රකා ....... ය. (ශ , ෂ)

(ලකුණු 05)

03) (අ) පහත සඳහන් වාක්‍ය නිදොස් කොට ලියන්න.

i. අම්මා ඊයේ පොළට යයි.
ii. සමහරුන් සමාජයට නිහඬ සේවයක් කරති.
iii. ආනන්ද හිමි බුදුන් වහන්සේට උපස්ථාන කළහ.
iv. සියලු ගංගා මුහුදට ගලා බසිති.
v. අයියා ද අක්කා ද මම ද උත්සවයට සහභාගි වූයෙමි. (ලකුණු 05)

(ආ) නිවැරදි වාක්‍යයක් සැකසීම සඳහා සුදුසු උක්ත පදය වරහනින් තෝරන්න.

i. සමහර (උපදේශකවරුන් / උපදේශකවරු) නායකතුමා නොමග යවති.
ii. (අයෙකු / අයෙක්) සමහරුන්ට නිකරුනේ දොස් නගති.
iii. ශ්‍රී ලාංකික (වනිතාවෝ / වනිතාවන්) රටේ ආර්ථිකය සඳහා වෙහෙසෙති.
iv. (අමරදේවයන් / අමරදේවයෝ) දක්ෂ සංගීතඥයෙකි.
v. (රාහුල හිමි / රාහුල හිමියෝ) පරෙවි සන්දේශය ලියූහ.

(ලකුණු 05)

(ඇ) පහත වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

i. වෙළෙන්දා බඩු ප්‍රවාහනය කරයි.
ii. සමනලයා මල් පැණි බිව්වේ ය.
iii. වැද්දා මුවන් දඩයම් කරයි.
iv. මම ජාතක පොත කියවමි.
v. අම්මා මා සනසයි.

(ලකුණු 05)

04) (අ) පහත සඳහන් පදවල විරුද්ධ පදය ලියන්න.
i. පරාජිත = ........................
ii. හිංසක = ........................
iii. දෘශ්‍යමාන = ........................
iv. දීන = ........................
v. දුදන = ........................

(ලකුණු 05)

(ආ) පහත සඳහන් පද සඳහා සමාන පද 02 බැගින් ලියන්න.
i. නෙළුම = ........................
ii. අකුරු = ........................
iii. අහස = ........................
iv. ගෘහය = ........................
v. සූර්යයා = ........................

(ලකුණු 05)

(ඇ) පහත දැක්වෙන පදවල ස්ත්‍රී ලිංග පද ලියන්න.
i. මොනරා.
ii. මුවා.
iii. ශිෂ්‍යයා.
iv. මාමා.
v. කුකුළා.

(ලකුණු 05)

05) (අ) පහත සඳහන් විසන්ධි පද සන්ධි කර දක්වන්න.

i. ඔවුන් + ඔවුන් =
ii. සූර්ය + උදය =
iii. පොල් + අත්ත =
iv. පුන + උත් =
v. සුළු + ඇඟිල්ල =

(ලකුණු 05)

(ආ) සමාස වර්ග 05 සඳහා නිදසුන් සමාස පද 05ක් ලියන්න.

i. අව්‍යය සමාසය = ...............................

ii. විභක්ති සමාසය = ...............................

iii. විශේෂණ සමාසය = ...............................

iv. අන්‍යාර්ථ සමාසය = ...............................

v. ද්වන්ද්වාර්ථ සමාසය = ...............................

(ලකුණු 05)

(ඇ) උපසර්ග සහිත පද 05ක් ලියන්න.

(ලකුණු 05)

06) බුදුගුණ අලංකාරයේ ඔබ කැමති කවි 03 ක් තේරුම සහිත ව ලියන්න.

(ලකුණු 15)

07) වන කතා කෘතියේ ඔබ කැමති කතාවක් ලියා ඉන් ගත හැකි ආදර්ශය ගෙන හැර දක්වන්න.

(ලකුණු 15)

08) මණි ප්‍රශ්නය , තඩාග ප්‍රශ්නය හා පුත්‍ර ප්‍රශ්නය යන මේවායින් එකක් ලියා, එය මහෞෂධ පණ්ඩිතයින් විසඳූ ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 15)

The National e-learning Portal for The General Education